# වී වගාව සඳහා තරුණ සේවා නියුක්තිකයන් අඩුවීමට බලපෑ හේතු සාධක පිළිබඳ අධ්‍යයනයක් : මහවැලි H කලාපය ඇසුරින්

එන්. කේ. දිනිති දූලංජි අමරසිරි[1]

## හැඳින්වීම

සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන ආදායම් මාර්ගය කෘෂිකර්මාන්තයයි. අතීතයේ දී ශ්‍රී ලංකාවට කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයෙන් සැලකිය යුතු විදේශ විනිමයක් ලැබුණ ද වර්තමානයේ කෘෂිකාර්මික භාණ්ඩ අපනයනය තුලින් සැලකිය යුතු විදේශ විනිමයක් නොලැබේ. එයට ප්‍රධාන හේතුවක් වනුයේ, කෘෂිකර්මාන්තය සඳහා තරුණ සේවා නියුක්තිකයන්ගේ සහභාගීත්වය අඩු වීමයි. මෙම අධ්‍යයනයේ දී තරුණයන් ලෙස අර්ථ දැක්වෙනුයේ, ශ්‍රී ලංකාවේ ජාතික තරුණ සේවා සභාව විසින් නිර්දිෂ්ට කර ඇති අවුරුදු 15-29 අතර පුද්ගලයන් වේ. එබැවින් මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ වී වගාව සඳහා තරුණ සේවා නියුක්තිකයන් අඩු වීමට බලපෑ හේතු සාධක පිළිබඳව අධ්‍යයනය කිරීමයි.

## ක්‍රමවේදය

වර්තමාන සමාජ ක්‍රමය තුළ සිදුවෙමින් පවතින කාලීන තොරතුරු පරීක්ෂා කර බලමින් ප්‍රාථමික හා ද්විතීය දත්ත රැස් කරගෙන ඒවා විවරණය කර වත්මන් සමාජයේ පවතින යථාර්ථය කෙබඳු දැයි අනාවරණය කර ගැනීමට මෙමඟින් හැකි වන නිසා මෙය විස්තරාත්මක පර්යේෂණ වර්ගයට අයත් වේ. ද්විතීය දත්ත රැස් කිරීමේ දී මීට අදාළ අධ්‍යයන වාර්තා එනම් අධ්‍යාපන සඟරා, ලිපි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සමීක්ෂණ වාර්තා සහ අදාළ වෙබ් අඩවි වාර්තා ද ප්‍රයෝජනයට ගනු ලැබිණි. සමීක්ෂණ ක්‍රමවේදය යටතේ දත්ත රැස් කිරීමට විවිධ ශිල්ප ක්‍රම යොදා ගත්ත ද ප්‍රශ්නාවලි ක්‍රමය මෙම පර්යේෂණයේ දී දත්ත රැස් කිරීමේ ප්‍රධාන ශිල්ප ක්‍රමය විය. සසම්භාවිත නොවන නියදුම් ක්‍රමය භාවිත කරමින් විනිශ්චය නියැදුම් ක්‍රමය ඔස්සේ, මහවැලි H කලාපයේ තඹුත්තේගම, තලාව, එප්පාවල, නොච්චියාගම, මහඉලුප්පල්ලම, ගල්නෑව සහ මීගලෑව යන කොට්ඨාස හතෙන් වයස අවුරුදු 15-29 ත් අතර තරුණයින් 70ක් නියැදිය ලෙස තෝරා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය. මහවැලි H කලාපය තුළ ප්‍රධාන ආර්ථික කටයුත්ත කෘෂිකර්මාන්තය වන අතර වී වගාව ප්‍රමුඛව එළවළු වර්ග, පළතුරු වර්ග මෙන්ම ලොකු ළූණු වගාවන් ද දැකිය හැක.

---

[1] සහකාර කථිකාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, dinithi.amarasiri99@gmail.com

එම වගාවන් අතුරින් සාම්ප්‍රදායිකව වී වගාව ප්‍රධාන ආර්ථික කටයුත්ත වශයෙන් සිදු කළ ගොවි පවුල්වල තරුණයින් නියැදිය ලෙස යොදා ගැනුණි. මෙලෙස ඒකරාශී කර ගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන උපක්‍රම ලෙස භාවිතා කළ හැකි කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් යොදා ගැනිණි.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

බොහෝ අධ්‍යයන මඟින් පෙන්වා දෙන ආකාරයට තරුණ සේවා වියුක්තිය ග්‍රාමීය ප්‍රපංචයකි. ඒ සඳහා බලපාන ලද ප්‍රධාන හේතුව වූයේ, ව්‍යුහාත්මක නිපුණතා නොගැළපීමයි. මෙවන් හේතු සාධක ගණනාවක ප්‍රතිඵලයක් වී ඇත්තේ වී වගාව සඳහා මහවැලි H කලාපයේ තරුණ සේවා නියුක්තිකයන්ගේ සහභාගීත්වය අඩු වීමයි. අධ්‍යයනය සඳහා තෝරාගත් නියැදියෙන් 34% ක්ම තම ජීවන වෘත්තිය ලෙස වී වගාව සිදු නොකරන අතර ඒ සඳහා බලපාන ප්‍රධාන හේතු කිහිපයකි. (එක් ප්‍රතිචාරියෙකු විසින් මෙහිදී ප්‍රතිචාර කිහිපයක් දක්වන ලදි.)

වී වගාව සඳහා මහවැලි H කලාපයේ තරුණ සේවා නියුක්තිකයන්ගේ සහභාගීත්වය අඩු වීමට බලපෑ හේතු සාධක

| හේතු | ප්‍රතිචාරීන් සංඛ්‍යාව | මුළු ප්‍රතිචාරීන් සංඛ්‍යාව (34) (ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|
| ඉඩම් නොමැතිකම | 14 | 41% |
| කළමනාකරණ හා තාක්ෂණික නිපුණතාවේ හිඟය | 4 | 12% |
| කන්න ක්‍රමයට වගා කිරීම නිසා එක් කලකට පමණක් රැකියාවන්හි නියුක්ත වීමට සිදු වීම | 18 | 53% |
| කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් වන නිශේධනාත්මක ආකල්ප | 23 | 68% |
| සුළු පරිමාණ ඉඩම් වගා කිරීම නිසා වැඩි ලාභයක් ලබා ගත නොහැකි වීම | 17 | 50% |
| හවුල් භුක්තිය | 9 | 26% |
| පෞරාණික ඉඩම් භුක්ති ක්‍රම | 3 | 9% |
| ග්‍රාමීය ජීවිතයේ සාම්ප්‍රදායික බල ව්‍යුහය | 4 | 12% |
| ප්‍රාග්ධන හිඟකම | 28 | 82% |
| අවිධිමත් ණයදෙන ආයතනවල ව්‍යාප්තිය | 11 | 32% |
| කෘෂි නිෂ්පාදන අලෙවියේ දී අතරමැදියන්ගේ මැදිහත්වීම | 17 | 50% |
| ඵලදායී සමුපකාර හා ගොවි සංවිධාන නොවීම | 6 | 18% |
| මඩ සහිත කුඹුරු වල වැඩ කිරීමට ඇති අකමැත්ත | 13 | 38% |
| වී ගොවිතැන මඟින් ලැබෙන ලාභය හෝ පාඩුව අවම වීම | 22 | 65% |
| අධ්‍යාපන සුදුසුකම් සමඟ නොගැළපීම | 20 | 59% |
| දෙමව්පියන් වෙනත් රැකියාවන්ට කැමත්ත දැක්වීම | 17 | 50% |
| සෞඛ්‍ය ගැටලු | 2 | 6% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය

තව ද වී ගොවිතැනෙහි රැකියා නියුක්ත තරුණ සේවා නියුක්තිකයෝ පූර්ණ කාලීන, අර්ධ කාලීන හා වැටුප් නොලබා පවුලේ ශ්‍රමිකයන් ලෙස ද සම්බන්ධ වූහ. අධ්‍යයනය මඟින් පැහැදිලි වූ ආකාරයට වී ගොවිතැනෙහි රැකියා නියුක්ත තරුණයන්ගෙන් 75%ක් අවුරුදු 5කට වැඩි අත්දැකීම් සහිත වූ අතර 25%ක්ම අවුරුදු 2කට අඩු අත්දැකීම් සහිත අය වූහ. විවාහක ප්‍රතිචාරීන්ගෙන් බහුතරය (82%)ක් ද අවිවාහක ප්‍රතිචාරීන්ගෙන් (18%)ක් ද පූර්ණ කාලීනව වී වගා කටයුතුවල නිරතවීමට කැමැත්ත දැක්වූහ. අධ්‍යයනයට අනුව අවිවාහක තරුණයන්ගෙන් බහුතරය සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් පවුල මත යැපෙති. කෙසේ වුව ද අවිවාහක අයට වඩා විවාහක ප්‍රතිචාරීන්ට පවුලේ වගකීම් දැරීමට සිදු වන බැවින් ඔවුන්ගෙන් බහුතරය වී වගාව සිදු කිරීමේ කටයුතුවලින් බැහැර වීමට වඩා ඒවායෙහි නිරත වීමට කැමැත්තක් දැක්වූහ. එමඟින් පැහැදිලි වනුයේ, තරුණ ප්‍රතිචාරීන්ගේ විවාහක අවිවාහකභාවය ද පූර්ණ කාලීන රැකියාවක් ලෙස වී වගාවෙහි නියුක්ත වීමට බලපා ඇති බවයි.

සසම්භාවිත නොවන නියැදුම් ක්‍රමය භාවිත කරමින් තෝරා ගත් නියැදියෙන් 23%ක් පූර්ණ කාලීන රැකියාවක් ලෙස වී ගොවිතැන සිදු කරනු ලැබීය. ඔවුන් එම ආර්ථික කටයුත්ත සිදු කිරීමට ප්‍රධාන හේතු වූයේ තමන් විසින්ම මෙහෙයවන රැකියාවක් වීම, වෙනත් රැකියාවක් සොයා ගැනීමට නොහැකි වූ බැවින් මෙම ආර්ථික කටයුත්ත සිදු කිරීම, මහා පරිමාණයෙන් වගා කටයුතු සිදු කරන නිසාවෙන් ඉහළ ආදායමක් ලැබිය හැකි වීම, පවුලේ සාමාජිකයන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැලීම, නගරයට සංක්‍රමණය වීමට පවතින මැලි බව සහ කෘෂිකර්මාන්තයට සම්බන්ධ අධ්‍යාපනික පුහුණුවීම් ලබා තිබීම යනාදී හේතු වේ. තවද අධ්‍යයනය මඟින් හෙළි වූ ආකාරයට පූර්ණකාලීනව වී වගා කටයුතුවල නිරත වන්නන්ගෙන් බහුතරයක් සතුවම තමන්ගේම වත්කමක් ලෙස ඉඩම් පැවතුණි. තම ඉඩම දියුණු කිරීමෙන් ලැබෙන සියලුම වාසි තමන්ට වන හෙයින් ඉඩම සංවර්ධනයට ඔවුන් ප්‍රශස්ත උත්සාහයක් දරා ඇත.

## නිගමන සහ යෝජනා

උක්ත කරුණු අනුව පැහැදිලි වනුයේ, වර්තමානයේ තරුණ සේවා නියුක්තිකයන් පූර්ණ කාලින රැකියාවක් තෝරා ගැනීම සඳහා ඉහළ ආදායමක් ඉපැයීම, රැකියාවෙහි පවතින සුරක්ෂිතතාව, ඉහල මට්ටමේ සමාජ පිළිගැනීම, දෙමව්පියන්ගේ කැමැත්ත, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සමඟ ගැලපීම යනාදී හේතු ගණනාවක් පාදක වී ඇති බවයි. මෙම සාධකයන්හි අඩු වැඩි බලපෑම මත වී

වගාව සඳහා තරුණ සේවා නියුක්තිකයන් අඩු වී ඇත. මෙම තත්ත්වය නිසාවෙන් අනාගතයේ දී සහල් විශාල වශයෙන් ආනයනය කිරීමට සි දු වන අතර එම තත්ත්වය අවම කර ගැනීම සඳහා ගොවි සංවිධාන වල නියෝජිතයින් සහ තරුණ සේවා නියුක්තිකයන් ඉදිරිපත් කරන යෝජනා කිහිපයකි. මූලික පහසුකම් සැපයීම, සහනාධාර ලබාදීම, ගුණාත්මක බවින් යුතු නිෂ්පාදන වෙළඳපලේ ඇති බවට සහතික කිරීමට පියවර ගැනීම, තාක්ෂණික දැනුම ලබාදීම, අලෙවි පහසුකම් සැපයීම, අස්වැන්න සඳහා සාධාරණ මිලක් ලබා දීම සහ පූර්ව අවධියේ සිට කෘෂිකර්මාන්තය පිළිබඳව යහපත් ආකල්ප ඇති කිරීම යනාදියයි. අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ, ඉහත යෝජනාවන් කෙරෙහි රාජ්‍ය සහ පෞද්ගලික අංශ අවධානය යොමු කරමින් ග්‍රාමීය අංශයේ තරුණ ශ්‍රමය ආර්ථිකමය වශයෙන් සක්‍රීය කරලීම සඳහා ප්‍රධාන ආර්ථික කටයුත්ත ලෙස වී වගාවෙහි නියුක්ත කළ හැකි බවයි.

ප්‍රමුඛ පද : තරුණයින්, සේවා නියුක්තිය, වී වගාව, පූර්ණ කාලීන

ආශ්‍රිත ග්‍රන්ථ

*ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ වාර්ෂික වාර්තාව.* (2012). ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

Chandrasiri, C.& Karunagoda, K.(2011). "Youth perception on farming as an occupation: Case study in Polonnaruwa District", Department of Agriculture

Damayanthi, M. K. N & Gamage, D. (2011). Transformation of Statistics, Colombo: Hector Kobbekaduwa Agrarian Research and training institute

Ministry of Labor Relations and Manpower, Central Bank of Sri Lanka & Department of Census and Statistics. (2009). Labor and Social Trends in Sri Lanka: Ministry of Labor Relations and Manpower.

Nanayakkara, A. G. W. (2004). Employment and unemployment in Sri Lanka-Trends, issues and options, Colombo: Department of Census and Statistics.